# මහජනතාව වෙත කරන දැනුම්දීමයි

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

## අනවසර මුදල් ව්‍යාපාර සහ තැන්පතු රැස්කිරීම
## 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත

**හෙට්ටි ආරච්චිලාගේ සහන් අකලංක**
**(ජා.හැ.අ. 951980234V)**
**සහ**
**ඇතන්ස් ඉන්ටර්නැෂනල් එඩියුකේෂන් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ්**
**(පීවී 00221899)**

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 42 වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉහත දැක්වෙන පුද්ගලයා සහ ආයතනය පිළිබඳ සිදු කරන ලද විමර්ශනය අතරතුර, මුදල් ව්‍යාපාර පනතේ 44(1) වගන්තියෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ හට පැවරී ඇති බලතලවලට අනුව, අංක 45/5 ඒ, දෙවන හරස් වීදිය, නව නගරය, පොළොන්නරුව ලිපිනයේ පදිංචි හෙට්ටි ආරච්චිලාගේ සහන් අකලංක යන අය සහ අංක 42/5 ඒ, දෙවන හරස් වීදිය, නව නගරය, පොළොන්නරුව ලිපිනයේ ලියාපදිංචි ඇතන්ස් ඉන්ටර්නැෂනල් එඩියුකේෂන් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින්;

1. අවබෝධතා ගිවිසුම් පත්‍රිකා හා/හෝ ඒ ආකාරයේ වෙනත් උපකරණ මගින් තවදුරටත් මුදල් ලබා ගැනීම හා/හෝ ණය ලබා දීම හා/හෝ නව ආයෝජනයන් සිදු කිරීම,

2. ඉහතින් සඳහන් කරන ලද පුද්ගලයාට සහ සමාගමට අයත් වත්කම් බැහැර කිරීම හෝ පැවරීම,

3. ඉහතින් සඳහන් කරන ලද පුද්ගලයාට සහ සමාගමට අයත් බැංකු හා අනෙකුත් ගිණුම්, දේපල හා ආයෝජනවලට අදාලව සියළු ගණුදෙනු සිදු කිරීම,

4. ඉහතින් සඳහන් කරන ලද පුද්ගලයා සහ සමාගම මගින් මුදල් ව්‍යාපාර පනතේ අර්ථ දක්වා ඇති ආකාරයේ තැන්පතු රැස් කිරීම,

2021.02.10 දින සිට ක්‍රියාත්මක වන පරිදි තහනම් කරන ලදී,

පරීක්ෂණ කටයුතු තව දුරටත් සිදු කරමින් පවතින බැවින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉහතින් සඳහන් කරන ලද පුද්ගලයාට සහ සමාගමට නිකුත් කර ඇති ක්‍රියාවිරහිත කිරීමේ නියෝගය ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉල්ලීම මත කොළඹ මහාධිකරණය විසින් 2021.07.16 දින දක්වා දීර්ඝ කර ඇති බව මහජනතාව වෙත දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ**
**බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01

011-2477000, 011-2440330, 011-2330220 @ dsnbfi@cbsl.lk www.cbsl.gov.lk